# 1

# ඊමාන් පිළිබඳ හැඳින්වීම

ආමන්තු බිල්ලාහ් ! මම අල්ලාහ් විශ්වාස කරමි.

මා මවනු ලැබුවේ අල්ලාහ් විසිනි. මිනිසා ගැහැනු හා පිරිමි වශයෙන් ඔහු මැවුවේ ය. විවිධ පාටවලින් හා විවිධ හැඩරුවෙන් යුක්තව මැවුවේ ය. විවිධ ජාතින් ඇති කළේ ය. විවිධ භාෂා කතා කරන්නන් ද බිහි කළේ ය. පවුල් සම්බන්ධතා ඇති කළේ ය. නෑදෑ හිතවතුන් ආදර සෙනෙහසින් බැඳ තැබුවේ ය. සියලු මැවීම්වලට වඩා උසස් තත්ත්වයක් මිනිසාට ලබා දුන්නේ ය.

අප ජීවත්වන මහපොළොව මැවුවේ ඔහු ය. ඉර, හඳ, තාරකා සහිතව වහලක ආකාරයෙන් අහස මැවුවේ ය. කණු මෙන් උස කඳු පොළව මත සිටවූයේ ය. වලාකුළු පුළුන් මෙන් පාවී යන්නට සැලැස්සුවේ ය. ගංගා ඇළ දොළ හා උල්පත් ආදිය පොළව මත ගලා යෑමට සැලැස්සුවේ ය. මිනිසා ජීවත් වීමට සුදුසු පරිදි මහපොළොව සකස් කළේ ය. ආමන්තු බිල්ලාහ්! මම අල්ලාහ් විශ්වාස කරමි.

ඔහු පොළොවේ ජීවින්ගේ පැවැත්ම සඳහා වායුගෝලය මැව්වේ ය. මිනිසාට ශ්වසනය කිරීම සඳහා ඔක්සිජන් වායුව ද ශාක ප්‍රභාසංස්ලේෂණය සඳහා



කාබන්ඩයොක්සයිඩ් වායුව ද මැව්වේ ය. මිනිසා පිටකරන කාබන්ඩයොක්සයිඩ් වායුව ශාක ප්‍රභාසංස්ලේෂණය සඳහා භාවිත කරන අතර මිනිසාගේ ශ්වසනය සඳහා අවශ්‍ය ඔක්සිජන් පිට කරන්නේ ය. මේ මගින් මිනිසා සහ ජීවින් අතර සම්බන්ධයක් ඇති කළේ ය. මෙම ක්‍රමවත් චක්‍රය ඇති කළේ අල්ලාහ් ය. ආමන්තු බිල්ලාහ්! මම අල්ලාහ් විශ්වාස කරමි.

උදෑසන ඉර නැග එන්නේ ය. ලොව අවදි වන්නේ ය. එවිට ජනයා තම දිනචර්යාවල නිරත වීමට පටන් ගන්නෝ ය. ඉපැයීම් ඇතුළු විවිධ කටයුතුවල යෙදෙන්නෝ ය. සවස ඉර බැස යන විටම ලොව අඳුර වැටෙන්නේය. වෙහෙස වූ ජනයා රාත්‍රියේ නිදාගන්නෝ ය. වෙහෙස නිවී නින්ද පහවී නැවත උදෑසන අවදි වෙති. දිනෙන් දින නොකඩවා පවතින මෙම පිළිවෙළ සකසන ලද්දේ අල්ලාහ් විසිනි. ආමන්තු බිල්ලාහ් ! මම අල්ලාහ් විශ්වාස කරමි.

අහසින් වැසි වසින්නේ ය. වියළීගිය පොළව තෙත් වන්නේ ය. තණකොළ වැවෙන්නේ ය. වැල් ඇදෙන්නේ ය. පැළ දලුලන්නේ ය. ගස් වැඩෙන්නේ ය. ආමන්තු බිල්ලාහ්! මම අල්ලාහ් විශ්වාස කරමි.

මේ සියල්ල ම සිදුවන්නේ එක ම ජලය මගින් ය. එහෙත් තණකොළ වැඩී කොළ පැහැයෙන් දිස් වන්නේ ය. මල් පිපී විවිධ වර්ණයෙන් දිලෙන්නේ ය. හරිත වර්ණයෙන් යුත් තෘණ බිම්වල ගවයින් තණ බුදින අයුරු බලන්න. සමනල්ලු මල් වලින් මල්පැණි උරා බොන්නෝ ය. පක්ෂිහු පළතුරු කමින්, නාදකරමින් සතුටු වන්නෝ ය. මිනිසා ද අනුමත ශාක හා සතුන් පිස අනුභව කරන්නේ ය. මෙතරම් ආශ්චර්යයත් සංවිධානයක් ඇති කළේ අල්ලාහ්ය. ආමන්තු බිල්ලාහ්! මම අල්ලාහ් විශ්වාස කරමි.





මිනිස් සිරුර තුළ ද අල්ලාහ් ගේ ආශ්චර්යවත් සංවිධානය දැකිය හැකි ය. ශ්වසන පද්ධතිය, ස්නායු පද්ධතිය, ජීර්ණ පද්ධතිය, රුධිර පද්ධතිය යන සියල්ල ක්‍රියාත්මක වන්නේ ක්‍රමවත්ව ය. දකින්නට දෑස්, අසන්නට කන්, රසවිඳීමට හා කතා කිරීමට දිව, යන සියල්ලෙහි ම අල්ලාහ්ගේ ආශ්චර්යවත් මැවීම් දැකිය හැකි ය. ආමන්තු බිල්ලාහ්! මම අල්ලාහ් විශ්වාස කරමි.

මෙසේ සියලු මැවීම්වල ම අල්ලාහ්ගේ ආශ්චර්යවත් සංවිධානය දැකිය හැකි ය. මේවා අහම්බෙන් හෝ ක්ෂණිකව හෝ බිහිවූ ඒවා නොවේ. දැනුම හා හැකියාව ඇති අල්ලාහ් විසින් මේවා මවා ක්‍රියාත්මක කරවන්නේයැ යි මම විශ්වාස කරමි. ඔහු පහළ කළ ආගම් විශ්වාස කරමි. අල්ලාහ් විශ්වාස කරන මුස්ලිම් වන මම ඔහුගේ මලායිකාවරුන් ද විශ්වාස කරමි. ඔහු පහළ කළ වක්තෘවරුන් ද විශ්වාස කරමි. අවසන් දිනයක් ඇති බව විශ්වාස කරමි. සියල්ල සිදුවන්නේ ඔහුගේ සැලැස්ම අනුව (කද්ර්) යැයි විශ්වාස කරමි. ආමන්තු බිල්ලාහ් ! මම අල්ලාහ් විශ්වාස කරමි.

**සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

1. සියල්ල මැව්වේ ...............................
2. ඔහු මිනිසුන් වශයෙන් ............................... මැව්වේ ය.
3. වර්ෂා ජලය පහළ කොට විවිධ.................... යුත් පලතුරු ඇති කළේය.
4. ....................පොළොව මත කණු මෙන් සිටවන ලදි.
5. ....................ඔක්සිජන් සහ කාබන්ඩයොක්සයිඩ් යන වායූන් මිශ්‍රව ඇත.

**කෙටි පිළිතුරු සපයන්න**

1. ආමන්තුබිල්ලාහ් යන්නෙහි අර්ථය කුමක් ද?
2. ශාක වර්ධනය කරවීම සඳහා අල්ලාහ් කුමක් ලබා දෙන්නේ ද?
3. මිනිසා රාත්‍රියේ දී වෙහෙස නිවා ගැනීම සඳහා අල්ලාහ් කුමක් දී තිබේ ද?
4. අල්ලාහ්ගේ මැවීම් හතරක් සඳහන් කරන්න
5. ඔබ භුක්ති විඳින අල්ලාහ්ගේ දායාදයන් පහක් සඳහන් කරන්න